## දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

## බෞද්ධ ශිෂ්ටාචාරය I - පිළිතුරුපත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 1 | 3 | 26 | 4 |
| 2 | 2 | 27 | 3 |
| 3 | 4 | 28 | 2 |
| 4 | 4 | 29 | 5 |
| 5 | 1 | 30 | 1 |
| 6 | 3 | 31 | 5 |
| 7 | 2 | 32 | 4 |
| 8 | 4 | 33 | 5 |
| 9 | 5 | 34 | 3 |
| 10 | 2 | 35 | 2 |
| 11 | 5 | 36 | 4 |
| 12 | 4 | 37 | 1 |
| 13 | 2 | 38 | 2 |
| 14 | 1 | 39 | 5 |
| 15 | 3 | 40 | 3 |
| 16 | 4 | 41 | 5 |
| 17 | 1 | 42 | 3 |
| 18 | 5 | 43 | 4 |
| 19 | 2 | 44 | 3 |
| 20 | 1 | 45 | 5 |
| 21 | 2 | 46 | 2 |
| 22 | 1 | 47 | 3 |
| 23 | 3 | 48 | 1 |
| 24 | 5 | 49 | 5 |
| 25 | 4 | 50 | 4 |

IMP-EXAM

### II පත්‍රය

1. i. බ්‍රාහ්මණ ඉගැන්වීම්වල දක්වෙන ආපද් ධර්ම හඳුන්වා දෙන්න.

- විපත්තීන් ලෙස බලපාන පොදු ආපදාපන්න තත්වයන් හෝ ඒ ඒ වර්ණයන්හි පුද්ගලයින් හට තම වර්ණයට නියමිත කාර්යන් ඉටුකිරීමට නොහැකි කිසියම් වූ ශාරීරික පීඩාවක් ඇති වූ අවස්ථාවන් අපදාපන්න අවස්ථා ලෙස සැළකේ. එහිදී අනුගමනය කිරීම සඳහා නිර්දිෂ්ට ධර්මය ආපද් ධර්මය නමින් හැඳින්වෙයි.
- ආපදා අවස්ථාවක දී බ්‍රාහ්මණයාට ක්ෂත්‍රිය, වෛශ්‍ය යන වර්ණවලට අයත් කටයුතුවල නිරත විය හැකි බව.
- සෙසු වර්ණවල ජනයාට පහළ ශ්‍රේණිවලට අයත් කටයුතු කරීමට හැකි වන අතර ශුද්‍රයනට අයත් කාර්යයන් කිසිසේත් ම වෙනස් නොවන බව.
- පහළ වර්ණවල ජනයාට, ඉහළ වර්ණවල ජනයාගේ කටයුතු කිරීමට නොහැකි බව. (ලකුණු 4යි)

ii. චතුර් ආශ්‍රම ධර්ම බෞද්ධ ඉගැන්වීම් තුළින් බැහැරවන අයුරු පෙන්වා දෙන්න.

- පුද්ගල ස්වාධීනත්වය බුදු දහමින් අවධාරණය කරන බැවින් තම ජීවිතය ද තමනට කැමැති ආකාරයෙන් පවත්වාගෙන යාමේ නිදහස පවතින බව
- විශේෂයෙන් බ්‍රහ්මචාරී ජීවිතය බුදු දහමින් අගය කරන අතර එය එක් අවධියකට පමණක් සීමාකොට නොතිබීම
- බුදු දහම අනගාරික ජීවිතය අගය කරන අතර ඒ සඳහා වැඩි අවධානයක් ආශ්‍රම ධර්ම තුළින් නොලැබීම
- අධ්‍යාත්මික විමුක්තිය උදාකරගැනීම උදෙසා අනගාරික ජීවිතය වැදගත් වන අතර එය ජීවිතයේ සැඳෑ සමයට සීමාකිරීමෙන් අපේක්ෂිත බලාපොරොත්තු ඉටුකරගැනීමට අපහසුවන බව
- සහජ කුසලතාවනට මේ තුළින් අවස්ථාව උදා නොවන බව (ලකුණු 4යි)

iii. මල්ල රාජ්‍යය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

- බටහිරින් ශාක්‍ය ජනපදය ද දකුණින් වජ්ජි රට ද මෙහි සීමාව වන බව.
- මල්ල රාජ්‍ය, කෝසිනාරකා හා පාවෙයියක යන කොටස් දෙකකින් යුක්ත ව පැවති බව.
- කෝසිනාරාවේ අගනුවර කුසිනාරා වන අතර පාවෙයියෙහි අගනුවර පාවා බව.
- ඔක්කාක වාංශික රාජාණ්ඩුවක් ව පැවති මෙහි පසු ව සමූහාණ්ඩුවක් ඇති වූ බව.
- උපවත්තන සල් උයන හා අනුපිය අඹ වනය මෙහි පිහිටා තිබෙන බව. (ලකුණු 4යි)

iv. බුද්ධකාලීන භාරතයේ ආර්ථික සංවර්ධනයට දායක වූ පේෂකර්මාන්තය හා කුම්භකාර වෘත්තිය පිළිබඳ තොරතුරු ගෙනහැර දක්වන්න.

- මෙම කර්මාන්ත දෙකට අදාළ තොරතුරු බෞද්ධ සාහිත්‍යය තුළින් අනාවරණය වේ.
- රෙදිපිළි ආශ්‍රිත කර්මාන්තය සඳහා ම ප්‍රචලිත ප්‍රදේශයක් වශයෙන් කසී රට සැලකෙන බව
- පේශකාර දියණියගේ කතාව හා විදේශ රටවලට පවා රෙදිපිළි අපනයනය කළ බව
- කුම්භකාර වෘත්තිය ද ගෘහාශ්‍රිත කර්මාන්තයක් වශයෙන් පැවැති බවට නිදසුන් දීඝති කෝසල ජාතකයෙන් ද හෙළිවන බව
- බුදුරදුන් පවා ඇතැම් දින රාත්‍රි ගතකර ඇත්තේ කුම්භකාර ශාලාවලය. උදා - පුක්කුසාති මල්ලවයා හමුවන්නේ කුඹල් හලකදීය. (ලකුණු 4යි)

v. නිගණ්ඨනාතපුත්ත ශාස්තෘවරයාගේ චතුයාම සංවරය පිළිබඳව විස්තර කරන්න.

- සබ්බවාරි වාරිතෝච හෝති සබ්බවාරි යුතෝච හෝති සබ්බවාරි ධුතෝච හෝති සබ්බවාරි ඵුටෝ ච හෝති
- යනුවෙන් සියලු ඇල්දියෙන් වැළකීම, සියලු ම සංවරයෙන් යුක්ත වීම, සියලු ම පව් වළකාලීම හා මෝක්ෂය ස්පර්ශ කිරීම යනු මොහුගේ චතුයාම සංවරය බව. (ලකුණු 4යි)

2. i චතුර් වෛශාරද්‍ය ඥානය පෙන්වා දෙන්න.

01. බුදුරජාණන් වහන්සේ තමා සම්මා සම්බුද්ධ යැ'යි දේශනා කරන විට එසේ නො වේ යැයි කිව හැකි ශ්‍රමණයකු, බ්‍රාහ්මණයකු, දෙවියකු, බ්‍රහ්මයකු නොමැති වීම.
02. බුදුරජාණන් වහන්සේ සියලු ආශ්‍රවයන් (කෙලෙස්) දුරු කර ඇතැ'යි දේශනා කරන කල්හි එය එසේ නො වේ යැයි අභියෝග කිරීමට තරම් අයකු නොමැති වීම.
03. බුදුරජාණන් වහන්සේ මේ ධර්මයන් නිවන් මඟට අහිතකර ය. මේවා අහිතකර නො වෙති යි දේශනා කරන විට එසේ නො වේ යැයි අභියෝග කිරීමට අයකු නොමැති වීම.
04. බුදුරජාණන් වහන්සේ කිසියම් අර්ථයක් සඳහා ධර්මය දේශනා කරන කල එම ධර්මයට අනුව කටයුතු කරන පුද්ගලයාගේ දුක මැනවින් කෙළවර නො වෙති'යි අභියෝග කිරීමට අයකු නොමැති වීම. (ලකුණු 4යි)

ii බුදුරදුන්ගේ ලෝකවිදූ ගුණය පිළිබඳ සංක්ෂිප්ත විවරණයක් සපයන්න.

බුදුරදුන් ලෝකය ස්වභාව වශයෙන් ද ලෝක සමුදය වශයෙන් ද ලෝක නිරෝධ වශයෙන් ද නිරෝධය පිණිස උපාය වශයෙන් ද (මාර්ගය වශයෙන්) යන සියලු ආකාරයෙන් ලෝකය දන්නා බැවින් ද අවබෝධ කළ බැවින් ද ලෝකවිදූ නම් වන බව. තව ද සංඛාර ලෝක, සත්තලෝක, ඔකාසලෝක යන තුන්ලෝකය සැම අයුරින් ම මැනවින් දන්නා බැවින් ලෝකවිදූ වන බව.

තුන් ලොව තතු ලෙසට - දැන ගෙන නොදත් මෙ ලොවට<br>
දෙසුයෙන් නියම කොට - ලෝකවිදූ යැ යි කියති මුනිඳුට (ලකුණු 4යි)

iii සිය ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ දක්ෂතා හඳුනාගෙන තනතුරු ප්‍රදානය සම්බන්ධයෙන් බුදුරදුන් ප්‍රකට කළ නිපුණතාව උදාහරණ හතරක් මගින් පෙන්වා දෙන්න.

ඒතදග්ග පාලියේ තනතුරු ප්‍රදානය කරන ලද ශ්‍රාවක -ශ්‍රාවිකාවන් පිළිබඳ ව විස්තර ඇතුළත් වේ. චිරරාත්‍රඥ තෙරුන් වහන්සේ අතර අඤ්ඤා කොණ්ඩඤ්ඤ තෙරුන්ට ද මහා නුවණැති ශ්‍රාවකයන් අතර සැරියුත් තෙරණුවන්ට ද, ඍද්ධිමත් තෙරුන් අතර මුගලන් හිමියන්ට ද ධූතාංගධාරීන් අතර මහා කාශ්‍යප තෙරුන්ට ද ආදි වශයෙන් භික්ෂූන් වහන්සේලාට මෙන් ම භික්ෂූණීන් වහන්සේලාට ද තනතුරු ප්‍රදානය කර ඇත.

ඒ අනුව චිරරාත්‍රඥ භික්ෂුණීන් වහන්සේ අතර අග්‍රස්ථානය මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියට ද මහා නුවණැතියන් අතර අග්‍රස්ථානය ඛේමා තෙරණියට ද ඍද්ධිමතුන් අතර අග්‍රස්ථානය උප්පලවණ්ණා තෙරණියට ද විනයධාරීන් අතර අග්‍රස්ථානය පටාචාරාවනට ද වශයෙන් තනතුරු ප්‍රදානය කර ඇත. (ලකුණු 4යි)

NWP-EXAM

iv බුදුරදුන් ප්‍රශ්න විසඳීමේ දී භාවිත කල ක්‍රම හතර දක්වන්න .

"අත්ථි භික්ඛවේ පඤ්හෝ ඒකාංස ව්‍යාකරණීයෝ විභජ්ජ ව්‍යාකරණීයෝ පටිපුච්ඡා ව්‍යාකරණීයෝ ඨපනීයෝ"[1]

**01) ඒකාංස ව්‍යාකරණීය :-**

ඇසූ ප්‍රශ්නයකට එක එල්ලේ ම පිළිතුරු ලබාදීමේ ක්‍රමයක් මේ මගින් ගම්‍යමාන කෙරේ. (ආලවක සූත්‍රය)

**02) විභජ්ජ ව්‍යාකරණීය**

මෙයින් අදහස් කෙරෙන්නේ අදාළ ප්‍රස්තුතය හෝ ධර්ම කාරණය හෝ විශ්ලේෂණය කොට බෙදා ඒ ඒ කොටස්වලට නිසි පරිදි පිළිතුරු ලැබෙන සේ දේශනා පැවැත්වීම යි. (සච්ච විභංග සූත්‍රය, මහා හත්ථිපදෝපම සූත්‍රය)

**03)පටිපුච්ඡා ව්‍යාකරණීය**

බුදුරදුන්ගෙන් ප්‍රශ්නයක් විමසූ කල ඇතැම් අවස්ථාවන්හි දී ඊට සමාන ප්‍රශ්නයක් අසා එයට ලැබෙන පිළිතුර අනුව ධර්ම කරුණු විවරණය කිරීම. (චූල්ල සච්චක සූත්‍රය)

**04)ඨපනීය**

ප්‍රායෝගික වැදගත්කමක් නොමැති ප්‍රශ්න බුදුරදුන්ගෙන් යමෙක් විමසා සිටිය හොත් එවැනි ප්‍රශ්නවලට බුදුරදුහු පිළිතුරු ලබා නොදුන්හ. එසේ පිළිතුරු ලබා නො දුන් ප්‍රශ්න ඨපනීය නම් වේ. (චූල්ල මාලුංක්‍ය සූත්‍රය)

(ලකුණු 4යි)

v සැරියුත් මහරහතන් වහන්සේ දේශනා කළ සූත්‍ර හතරක් නම් කරන්න.

- දීඝ නිකායේ සංගීති සූත්‍රය දීඝ නිකායේ දසුත්තර සූත්‍රය මජ්ඣිම නිකායේ සම්මාදිට්ඨි සූත්‍රය මජ්ඣිම නිකායේ ගුලිස්සානි සූත්‍රය මජ්ඣිම නිකායේ සච්ච විභංග සූත්‍රය ආදිය දේශනා කර ඇති බව. (ලකුණු 4යි)

3. i අටසිල් පිළිවෙලින් නම් කරන්න.

1. පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි
2. අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
3. අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛාපදං සමාදියාමි
4. මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි
5. සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
6. විකාලභෝජනා වේරමණී සික්ඛාපදං සමාදියාමි
7. නච්ච ගීත වාදිත විසූක දස්සන මාලා ගන්ධ විලේපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
8. උච්චාසයනා මහාසයනා වේරමණී සික්ඛාපදං සමාදියාමි (මෙයසිංහලෙන් ලියා තිබුනද ප්‍රමාණවත්ය.)

(ලකුණු 4යි)

ii සිගාලෝවාද සූත්‍රයට අනුව බටහිර දිසාව නියෝජනය කරන පිරිසගේ යුතුකම් හා වගකීම් වෙන් වෙන්ව ඉදිරිපත් කරන්න.

බටහිර දිසාව නියෝජනය කරන්නේ ස්වාමි භාර්යා දෙපොළ බව ඒ අනුව **ස්වාමියාගෙන් භාර්යාවට ඉටුවිය යුතු යුතුකම් වන්නේ**

1. බිරිඳට ගරුකිරීම. - සම්මානනාය
2. අවමන් නොකිරීම. - අනවමානනාය
3. අනාචාරයේ නොහැසිරීම. - අනතිචරියාය
4. සම්පත් පවරාදීම. - ඉස්සරියවොස්සග්ගේන
5. අලංකාර වස්ත්‍රාභරණ සපයාදීම. - අලංකාරානුප්පදානේන

**භාර්යාවගෙන් ස්වාමියාට**

1. ගෘහකටයුතු මැනවින් සංවිධානය කිරීම. - සුසංවිහිත කම්මන්තා
2. ඇසුරු කරන පිරිවර ජනයාට මැනවින් සංග්‍රහ කිරීම - සුසංගහිත පරිජනා
3. අනාචාරයේ නොහැසිරීම. - අනතිචාරිනී
4. ස්වාමියා උපයන ලද ධනය ආරක්ෂාකිරීම. - සම්භතං අනුරක්ඛති
5. සියලු කටයුත්තකම දක්ෂ හා අනලස නොවීම. - දක්ඛා ච හෝති අනලසා සබ්බකිච්චේසු (ලකුණු 4යි)

iii පරාභව සූත්‍රයෙහි දැක්වෙන නිද්දාසීලී සභාසීලී යන ගාථාවේ ඇතුළත් පිරිහීමේ කරුනු දක්වන්න.

- 1. නිතර නිදන සුළුබව 2. දොඩමළුව පිරිස සමග කාලය ගතකිරීම 3. උට්ඨාන වීර්යෙන් තොරවීම 4. අලසකමින් යුක්තවීම 5. ක්‍රෝධ බහුලවීම (ලකුණු 4යි)

[1] අංගුත්තර නිකාය II, 2006, පඤ්හ ව්‍යාකරණ සූත්‍රය, බු.ජ.මු., පිටුව 90

iv ''ජයං වේරං පසවති- දුක්ඛං සේතිපරාජිතෝ
උපසන්තෝ සුඛං සේති - හිත්වා ජයපරාජයං''(ලකුණු 4යි)

v එහි තේරුම ලියන්න..

- **තේරුම** :- දිනන්නා පරදින්නා තුළ වෛරය ඇති කරයි. පරදින්නා දුක සේ වෙසෙයි. (රාගාදි කෙලෙසුන් කෙරෙන් මිදුණු) උපශාන්තයා ජයත් පරාජයත් හැර සුවසේ වෙසෙයි. (ලකුණු 4යි)

## ii කොටස

4. i ජනතාවාදී පාලන ක්‍රමයකට අදාළ ඉගැන්වීම් බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්ම තුළ ගැබ්ව ඇති බව පෙන්වා දෙන්න.

- අග්ගඤ්ඤ සූත්‍රයට අනුව පාලකයා සහ රජය බිහිවන්නේ ජනතාවගේ ආරක්ෂාව හා අයිතීන් සුරක්ෂිතකිරීම පිනිසයි. පාලකයා රජ යන නමින් ආමන්ත්‍රණය කරණු ලැබුවේද ජනතාව සතුටට පත්කරවන බැවිනි. බෞද්ධ දේශපාලන මූලධර්ම අනුව පාලකයාගේ ප්‍රධාන වගකීම ජනතාවගේ සුභසාධනය පිළිබඳ සොයා බැලීමයි.
- ශ්‍රේෂ්ඨ පාලකයකු විසින් අනුගමනය කළයුතු පාලන මූල ධර්ම රැසක් බුදු දහමෙහි දක්වා ඇත.
- පඤ්චශීල ප්‍රතිපදාව, දසරාජ ධර්ම, දස සක්විත්වත්, සප්ත අපරිහානීය ධර්ම, සතර සංග්‍රහ වස්තු, සතර අගතියෙන් වෙන්වීම
- මෙම දේශපාලන මූලධර්ම සහ කූටදන්ත සූත්‍රය ආදී සෙසු සූත්‍රදේශනාවල අන්තර්ගත රාජ්‍ය පාලනය හා බැඳි සාරධර්ම ජනතාවාදී රාජ්‍ය පාලනයක් බිහිකරගැනීමෙහිලා හේතුවන බව (ලකුණු 10යි)

ii පුද්ගල ස්වාමිත්වය, ස්වාධීනත්වය හා ස්වච්ඡන්දතාව පිළිබඳ සමකාලීන ඉගැන්වීම් බෞද්ධ ඉගැන්වීම් තුළින් ප්‍රතික්ෂේප වන අයුරු විමර්ශනය කරන්න.

- බෞද්ධ හේතුඵල ධර්මයෙන් ඊශ්වර නිර්මාණවාදය, පුබ්බේකතහේතුවාදය හා නියතිවාදය බැහැර වන බව.
- මිනිසාගේ ස්වාධීනත්වය මිනිසාට පවරා ඇති බව හා බාහිර ගැලවුම්කරුවකු මත රඳවා නොමැති බව.
- තම සුගතිය මෙන් ම දුගතිය ද විමුක්තිය මෙන් ම බන්ධනය ද තමාගේ ම ක්‍රියාකාරිත්වය මත රඳා පවතින්නේ යැයි බුදු දහමේ උගන්වන බව.
- අත්තකාර, පරකාර, ආරම්භක ධාතු, නික්කම ධාතු, පරක්කම ධාතු, ථාම ධාතු, ඨිති ධාතු, උපක්කම ධාතු යන ඉගැන්වීම් මඟින් පුද්ගල ශක්තිය අර්ථවත් කෙරෙන බව.
- කවර හෝ අදෘශ්‍යමාන නියතියකට පුද්ගල පෞරුෂය යටත් නොකොට ස්වාමිත්වය, ස්වාධීනත්වය, ස්වච්ඡන්දතාව හා වගකීම අර්ථවත් කොට ඇති බව.(ලකුණු 10යි)

5. i සමාජ සදාචාර සංවර්ධනයෙහි ලා හිරිඔතප් දෙකෙහි පවත්නා කාලීන වැදගත්කම අගයන්න.

- පව්කම් හෙවත් ළාමක ක්‍රියා විෂයෙහි ලජ්ජාව සහ බිය හිරි ඔතප් නම් වන බව.
- පවට ලජ්ජා බය ඇතිව කටයුතු කිරීම තුළින් සුචරිතවත් සමාජයක් බිහිවීමෙහිලා ඉවහල්වන බව
- සමාජයක යහපැවැත්මට එම සාරධර්ම අත්‍යවශ්‍ය වන බව.
- ලෝකපාලක ධර්ම හෙවත් දේවධර්මය ලෙස ද හිරි ඔතප් හඳුන්වා ඇති බව. (ලකුණු 10යි)

ii පරිසර හිතකාමී සමාජයක් බිහිකර ගැනීමෙහිලා බුදු දහමින් ලැබෙන පිටිවහල ඇගයීමට ලක්කරන්න.

- පරිසර සංරක්ෂණය සඳහා අදාළ කරගත හැකි අගනා උපදෙස් රැසක් බුදුසමයෙහි ඇතුළත් බව.
- බුදු රජාණන් වහන්සේ මෙන් ම ශ්‍රාවක භික්ෂූන් ද පිවිතුරු සුන්දර පරිසරයට ඇලුම් කළ බව හා සමීප වූ බව.
- සංයුක්ත නිකායේ වනරෝප සූත්‍රයේ වෘක්ෂලතා හා පරිසරය සංරක්ෂණයට අදාළ ඉගැන්වීම් ඉදිරිපත් කොට ඇති බව. ආරාම රෝපා වන රෝපා යේ ජනා සේතු කාරකා පපඤ්ච උදපානංච යේ දදන්ති උපස්සයං තේසං දිවාච රත්තෝච සදා පුඤ්ඤං පවඩ්ඪති ධම්මට්ඨා සීල සම්පන්නා තේ ජනා සග්ගගාමිනෝ
- විනය ශික්ෂාවන්හි මෙන් ම සේඛියාවල ද පරිසර සංරක්ෂණයට අදාළ කරුණු ඇතුළත් වන බව.
- ගස්වැල් සිඳීම, සියලු ආකාරයේ පැළ වන බීජ සිඳීම භික්ෂූන්ට ආපත්ති ලෙස දක්වා ඇති බව.
- වර්තමාන මිනිසාගේ ඇතැම් ක්‍රියාකාරකම් පරිසරයට අහිතකර ලෙස බලපා ඇති බව සහ එය මිනිසා සහිත සත්ත්ව හා ශාක ප්‍රජාවේ යහපැවැත්මට තර්ජනයක් වී ඇති බව.
- ජලයට මුත්‍රා කිරීම, මලපහ කිරීම, කෙළ ගැසීම භික්ෂූන්ට තහනම් කොට ඇති බව.
- නිල් තණ පිට්ටනිවල මුත්‍රා කිරීම , මලපහ කිරීම, කෙළ ගැසීම භික්ෂූන්ට තහනම් කොට ඇති බව. බුදු දහමේ දක්වෙන මෙම කරුණු සැළකිල්ලට ගෙන ක්‍රියාකිරීමෙන් පරිසර හිතකාමී සමාජයක් බිහිවෙන බව අවධාරණය විය යුතුයි (ලකුණු 10යි)

6. i. ධනෝපාර්ජනය හා ශ්‍රමය අතර පවත්නා අන්‍යෝන්‍ය සම්බන්ධය බෞද්ධ ඉගැන්වීම් ගෙනහැර දක්වන්න.

- බුදු සමයේ එන ආර්ථික චින්තනය කිසිදු දේව විශ්වාසයක් මත පදනම් වූවක් නොවේ. අස්වාභාවික දේව මිථ්‍යා කතා වලින් බැහැර වූ බෞද්ධ ආර්ථික දර්ශනය නිෂ්පාදන කටයුතු හා සම්බන්ධ ව විග්‍රහයක් ඉදිරිපත් කරන්නේ මිනිස් ශ්‍රමය ඇසුරෙනි.
- සමාජ විකාශයේදී මිනිස් සමාජය විවිධ සමාජ කණ්ඩායම්වලට වර්ගීකරණය වූයේ ද දේව නිර්මාණයක් නිසා නොව ආර්ථික දේශපාලන හා වෙනත් විවිධ කටයුතු සඳහා ශ්‍රමය වැයකළ ආකාරය අනුව බව දී. නි. අග්ගඤ්ඤ සූත්‍රයෙන් පැහැදිළි වන බව
- නිෂ්පාදන සඳහා මිනිස් ශ්‍රමයේ උපයෝගීතාවත් නිෂ්පාදනය හා ශ්‍රමයේ උපයෝගීතාවත්. නිෂ්පාදනය හා ශ්‍රමය කෙසේ සම්බන්ධ විය යුතු ද යන්නත් පිළිබඳව බොහෝ සූත්‍රවල සාකච්ඡා කෙරේ.
- දීඝජානු කෝලිය පුත්‍රයාට දේශනා කළ ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ ද අනේ පිඩු සිටුවරයාට දේශනා කළ පත්ත කම්ම
- හා අනණ සූතයන් ඇතුළු සූත්‍ර ගණනාවක ශ්‍රමය වැයකොට ධනය නිෂ්පාදනය කළයුතු බව අවධාරණය කරයි. (ලකුණු 10යි)

ii. චතුර්විධ සුඛය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් තෘප්තිමත් ගෘහ ජීවිතයක් සඳහා උපයෝගීවන ආකාරය විස්තර කරන්න.

- මිනිසා සුඛකාමී සත්ත්වයකු ලෙස බුදුසමය පිළිගන්නා නමුදු කාමසුඛල්ලිකානු යෝගය බැහැර කරන බව.
- සසර දුක් සහිත යැයි බුදුසමය අවධාරණය කරන නමුදු එහි සැපයක් නැතැයි ඉන් අදහස් නොවන බව සහ සදාචාරාත්මක සීමාවන් තුළ ගිහි බෞද්ධයා ලෞකික වූ පස්කම් සුව විඳීම බෞද්ධ ඉගැන්වීම්වලට විරුද්ධ නොවන බව.
- අත්ථි, භෝග, අනණ, අනවජ්ජ යන සුඛයන් ගිහි සැපය සම්බන්ධයෙන් වැදගත් වන අතෘප්තිමත් ගෘහ ජීවිතයක් ගත කිරීමට මෙම එක් එක් සැපයන්හි පවත්නා වැදගත්කම අවධාරනය විය යුතුය. (ලකුණු 10යි)

7. i. පැරණි භාරතීය විශ්වවිද්‍යාල අතුරෙන් නාලන්දා විශ්වවිද්‍යාලයට හිමිවන සුවිශේෂත්වය ප්‍රකට කරන්න .

- භාරතයේ ඉපැරණි සෙසු විශ්වවිද්‍යාලයන්ට පූර්වාංගම වී ඇත්තේ නාලන්දාව බව
- මෙය ක්‍රි. පූ. 415-455 වකවානුවේ රජකළ ශක්‍රාදිත්‍ය හෙවත් කුමාරගුප්ත රජු ආරම්භ කළ බව
- සිසුන් දසදහසක් පමණ අධ්‍යාපනය ලැබූ ආචාර්යවරුන් 1500 පමණක් ඉගැන්වීම් කටයුතුවල නිරතවූ පශ්චාත් උපාධි දක්වා උපාධි පිරිනැමූ ආයතනයක් බව
- නාලන්දාවේ මූලික විෂය ධාරා පහක් යටතේ ඉගැන්වීම් ක්‍රමවේද තුනක් භාවිත කෙරුණු බව
- සුවිශාල පුස්තකාලයක් කීර්තිමත් ආචාර්ය මණ්ඩලයක් සහ ශාස්ත්‍රීය හා පර්යේෂණාත්මක ග්‍රන්ථ සමුහයක් මෙම විශ්ව විද්‍යාලය තුළින් බිහිවූ බව යන කරුනු ඇසුරෙන් විස්තර වියයුතුයි. (ලකුණු 10යි)

ii. බුදුරජාණන් වහන්සේ ධරමාන සමයෙහි බුදු දහමෙහි සීග්‍ර ව්‍යාප්තියට තුඩුදුන් හේතු කවරේදැයි පිරික්සන්න.

- ශාස්තෘවරයෙකු වශයෙන් බුදුරදුන් තුළ පැවැති අසමසම පෞරුෂය හා ධර්ම සන්නිවේදකයකු වශයෙන් අනුපමේය සන්නිවේදන හැකියාව මෙන් ම විචිත්‍ර දේශනාක්‍රම යොදාගැනීම
- බුදුරජාණන් වහන්සේ රජපෙළපතකින් පැවැත එන දෙතිස් මහාපුරුෂ ලක්ෂණයන්ගෙන් යුක්ත උසස් කෙනෙකු බව
- බුදු දහම මුල මැද අග ස්වාක්ඛාත, අකාලික, ඒහිපස්සික ආදී ගුණාංගයන්ගෙන් යුත් දහමක් වීම.
- රහත්භාවයට පත් ශ්‍රාවක ධර්ම සන්නිවේදකයින් වහන්සේලා ගම් නියම්ගම් සැරිසරා දහම ප්‍රචාරය කිරීම
- තරුණ පිරිස් දහස් ගණනින් බුදුරජාණන් වහන්සේ මගින් සහ ශ්‍රාවකයින් වහන්සේලා මගින් ධර්මාවබෝධය ලබා ගැනීම
- රජවරු, සිටුවරු, මැති ඇමැතිවරු බුදු දහම වැළඳ ගැනීම සහ බුදු සමය ව්‍යාප්ත කිරීම සඳහා දක්වන ලද පූර්ණ අනුග්‍රහයන් ද බුදු දහමේ සීඝ්‍ර ව්‍යාප්තියට හේතුවිය. (ලකුණු 10යි)

8. I. අභයගිරි සම්ප්‍රදායේ ප්‍රභවය ශ්‍රී ලාංකේය ආගමික හා දේශපාලන ඉතිහාසය තුළ ව්‍යාකුලත්වයක් නිර්මාණය වීමෙහිලා පාදක වූ අයුරු විමසීමට ලක්කරන්න.

- වළම්බා රජු ගිරි නිගණ්ඨයාගේ ආරාමයක් සාදවා මහාතිස්ස හිමියන්ට පිළිගැන්වීමට කටයුතුකිරීම නිසා ආගමික දේහපාලනික ගැටලු රාශියක් ඇතිවීම
- පසුකාලයේදී අභයගිරිය මහායානයට අයත් වෛතුල්‍යවාදය වජිරියවාදය වැනි ඉගැන්වීම් පිළිගත් ස්ථානයක් වීම මහායානික අදහස් ව්‍යාප්තියට ඉඩසැලැස්වීම
- වෝහාරික තිස්ස රජු දවස වෛතුල්‍යවාදී පොත්පත් ගිනිතැබීම, ගොඨාභය රජු දවස වෛතුල්‍යවාදී අදහස් දැරූ භික්ෂූන් වහන්සේලා 60 නමක් වෙර ලකුණු යොදා රටින් පිටුමහල් කිරීම
- ජෙට්ඨතිස්ස රජු සංඝමිත්‍රගේ අදහස් නොපිළිගැනීම හා මහසෙන් රජු සංඝමිත්‍ර භික්ෂූවගේ උපදෙස් මත මහාවිහාරය විනාශකිරීම
- රජවරු අභයගිරිය හා මහාවිහාරය වශයෙන් වෙන්වෙන් වශයෙන් බෙදාගෙන අනුග්‍රහය දැක්වීම (ලකුණු 10යි)

ii පැරණි ශ්‍රී ලංකාවේ රජයත් බුදු දහමත් අතර පැවැති අන්‍යෝන්‍ය සම්බන්ධය ඓතිහාසික නයින් පරීක්ෂා කරන්න.

- මිහිඳු හිමියන් විසින් බුදුසසුන පිහිට වූ දා පටන් බටහිර ආක්‍රමණ හේතුවෙන් සිංහල රාජ්‍ය බිඳවැටෙන තෙක්ම ශ්‍රී ලංකාවේ පාලකයා බෞද්ධයෙකු විය යුතුය යන අදහස ශ්‍රී ලාංකික ජන සමාජය තුළ මුල් බැසගෙන තිබුණි.
- ක්‍රි. ව. 10වන සියවසවන විට මේ අදහස තවදුරටත් සංවර්ධනය වී ශ්‍රී ලංකාවේ රජු බෞද්ධයෙකු පමණක් නොව බෝධිසත්වයෙකු විය යුතු බවත් මේ විවරණය ලැබුනේ සර්වඥ වූ බුදුරදුන්ගෙන් ම බවත් සඳහන් කරමින් සෙල්ලිපි පවා ප්‍රකාශකොට 4වන මිහිඳු රජුගේ පුවරු ලිපියක මේබව සඳහන් වේ.
- පූජාවලියේ මිථ්‍යාදෘෂ්ඨිකයන්ට මෙහි බලය හිමි නොවන බවත් සම්‍යක් දෘෂ්ඨික රජුන්ට පමණක් මෙහි පැවැත්ම ඇතිබව සඳහන්වේ.
- එළාර වැනි ද්‍රවිඩ පාලකයන් පවා බලය පවත්වා ගැනීමේ අදහසින් බුදු සසුන වෙනුවෙන් යම් යම් යහපත් ක්‍රියාකාරකම් කර ඇත. බුද්ද පාරින්ද වැනි ද්‍රවිඩ පාලකයින් බුද්ධදාස යනුවෙන් නම පවා වෙනස් කිරීමට පෙළඹුනේ තම පාලනයේ පැවැත්ම තහවුරු කරගැනීමේ අරමුණෙනි.
- ක්ෂත්‍රියකු රජවන්නේ බුදුරජාණන් වහන්සේ පාත්‍ර ධාතුව හා චීවර ධාතුව ආරක්ෂා කිරීමට බව 10 වන සියවසේ ලියවුන මිහිඳු රජුගේ සෙල් ලිපියෙන් පැහැදිලිය.
- දේවානම් පියතිස්ස රජුට මිහිඳු හිමියන් උපදේශකත්වය සැපයුවා සේම සෙසු බොහෝ පාලකයන්ට උපදේශකත්වය සපයන ලද්දේ භික්ෂූන් වහන්සේ විසිනි.
- දුටුගැමුණු රජු එළාර ඇතුළු ද්‍රවිඩයින් සමග සටන් වැදුනේ සම්බුද්ධ ශාසනයේ පැවැත්ම අරමුණුකරගෙන බව යනාදී වශයෙන් කරුණු ඉදිරිපත් කරමින් පිළිතුර සකස් වියයුතුය. (ලකුණු 10යි)